# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1698/9 – 2011 මාර්තු 22 වැනි අඟහරුවාදා – 2011.03.22

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: කල්/6/ඉඩම/669.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:එල්ඩී/05/2007/ඊ/03.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 630 සී. මණ්ඩලකුඩාව ග්‍රාම නිලධාරි වසමේ කල්පිටිය ගමේ සර්වේයර් ජනරාල්ගේ අංක පු. 4709 හා 2010.08.31 දිනැති මුලික පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1285 ක් පමණ වූ අල්අක්ෂා ජාතික පාසැල සඳහා අත්පත් කර ගැනීමට අදාළ ඉඩම.

ඉඩමේ නම: විදුවලවිකානි; විස්තරය: සර්වේ ජනරාල්ගේ අංක පු 4709 පිඹුරේ කැබලි අංක 01; හිමිකම් කියන අය: එම්. ඊ. වල්කිසුම්මා සහ ඒ අලීසාතුම්මා; ප්‍රමාණය: හෙක් 0.1285

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2011 මැයි 26 වෙනි දින පෙ.ව. 09.00ට කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 මැයි මස 19 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. එච්. එම්. රියාල්දීන්,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය

2011 මාර්තු මස 03 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කල්පිටිය

04 - 246

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: හපු/ඉඅත්/1/18.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 13/99/ඩබ්එස්/339.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

1A – G 14296 – 420 (2011/03)

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ ඇල්ල අළුත්වෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද 1997.04.08 දිනැති අ.ග.පි. අංක 387 පත්‍ර 37 අතිරේක 36 දරන මූලික පිඹුරේ කැබලි අංක 1550 වශයෙන් දැක්වෙන උඩබැද්ද පතන නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.048 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංක 1550 – උඩබැද්ද පතන – ප්‍රමාණය: හෙක්. 0.048ක් පමණ**

උතුරට: කැබලි අංක 1551; නැගෙනහිරට: කැබලි අංක 1551 හා 1237; දකුණට: කැබලි අංක 1237 හා 1235; බටහිරට: කැබලි අංක 1235

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2011 මැයි 16 වෙනි දින පෙ.ව. 10.30ට හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය

තවද, 2011 මැයි මස 09 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ආර්. ධර්මසිරි පියසේන,
ප්‍රාදේශීය ලේකම්,
හපුතලේ.

2011 පෙබරවාරි මස 21 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

04 - 247